# සරලත්වය හා විශ්‍රාන්තිය

ජේ.එම්.සී.කේ. සෙනෙවිරත්න

ඉරිතැලී පැළී ගිය වියළි වූ මහ පොළොව මතට පින්වන්ත වැහි බින්දු වැටෙන විට නාස්පුඩු තුළට ගලා එන සුවඳ නැවුම් ජීවන ඇණෑල්ලක පහස හරි අපූරුවට කියාපායි. වල් වැදුණු බිම දැතේ වීරියෙන් එළිපෙහෙළි කර අස්වද්දනට යත්න දරන මිනිසා මේ මහ පොළොවේ ගුණ සුවඳ, හිතවත් බව තම හදවතට හෘදයාංගමව සමීප කරගනී. '' එදින සිදු වූ ඉතාමත්ම වැදගත් දේ වන්නේ කලාතුරකින්වත් මිනිස් පහසක් නොලත් ඒ ගන කළු වන බිමේ තෝරාගත් තැනකට තවත් එක් අපූරු මිනිස් ජීවියකු විසින් සිය පළමු උදලු පහර එල්ල කිරීමය. මෙය මහින්ද ප්‍රසාද් මස්ඉඹුලයන්ගේ '' මානික්කාවත'' නම් වූ ප්‍රබන්ධ කතාවේ ඇරඹුමයි. කුළුඳුල් වන පියස යට නව ජීවන ඇරඹුමක් උදෙසා පිළිපන් ගැහැණියක් හා පිරිමියෙක් මුල් කර ගනිමින් අතීතයේ එක් කාල වකවානුවක ජීවත් වූ මිනිස් වාසයක ගෙවී යාම සොබා දහම හා මුහුකරමින් පාඨකයා වෙත වෙනස්ම ආරක වූ ප්‍රබන්ධ කතාවක් වන ''මානික්කාවත'' කෘතිය මහින්ද ප්‍රසාද් මස්ඉඹුලයන් විසින් නිර්මාණය කර ඇත. පිටු 165 කින් යුක්ත වේ. මාණික්කාවතක වින්දනයේ පැහැය ඔප මට්ටම කර බලන්නට එහි අකුරු අතර ගමන් කළෙමි.

මහපොළොවේ සාරය උරාගත් වී ඇටයෙන් ඉදෙන බත අතීත සිංහල ජනයාගේ මා හැඟි සම්පත විය. තිරිඟු පිටි වල ඇති සැරපරුෂ බව නොදත් ඔවුන් බත තුළින් තම ජීවය පවත්වාගෙන ගියහ. නව අස්වැන්නක පැහැය දකින්නට ගොවියා බොහෝ සේ කැමතිය අනාගත අස්වැන්නක සිහින තුළින් මානසික සතුටක් ලබන්නට ඔවුන් පුරුදුව සිටියහ. '' ඒ පැස තුළ වූයේ කිරිපාට මොටැයියන් ඇද තිබූ වී අහුරකි. ඒ දකිත්ම ඔවුන්ගේ මුහුණ දීප්තිමත් වූයේ ජීවත් වීමට අවශය තරම් බලාපොරොත්තුවක් මේ මහගු සම්පත තුළ සැඟවී ඇති බව දැනුණු නිසාය. කුහුඹුවකු තම කර මතින් වී ඇටක් රැගෙන යන අයුරු දැක අනාගත අස්වැන්නේ සිහිනය දකිමින් සංතෘප්විදායක වූ හැඟීමක් හදවත තුළ ගොඩ නගා ගනී. ' ඕං බලාපල්ලා අස්වැන්න කර තියාගෙන යන අපූරුව... ඕකට ඉතින් එපා කීහැකැ... කුඹුරකින් කොයිතරම් නං උදවිය බඩ පුරෝගන්නව ද කාරි නෑ මේ උන්ගෙත් මහ පොළොව නොවැ'' නින්දේ දී සිහින දැකීම ඕනෑම කෙනෙකුට පොදු වූ අත්දැකීමකි. නරක සිහිනයක් දුටු විට සමහරෙකුට නින්ද නොයයි. බියට පත් වේ. එය මගහරිනු වස් සිංහල ජනයා තමාට සුවදායි සුබවාදී නින්දක් උදෙසා බුදු දහමේ පිහිට පැතුහ. '' ඉතිපිසෝ '' ගාථාව මතකෙට අරං ආයේ නිදාගං. හා නිදාගං මයේ අම්මා. ඇය යළි නින්දේ ය.''

බුදු දහම මානසික වින්දනය උදෙසා භාවිතා කළ හැකි ප්‍රබලම ඖෂධයකි. සීතල තනිකම, පාළුව මකාගන්නට මෙන්ම සතුට උදෙසා සිංහල ගැමියා රාත්‍රී කාලයට පැල් කවි ගයන්නට පුරුදුව සිටියහ. '' හීතලේ බැරිය මේ රට උහුලන්ඩ - කේතලේ වතුර හෙම නැතිව ද බොන්ඩ - දුංකල ටිකක් දීහං මට විට කන්ඩ - පිං කළ ළඳේ දොර ඇරහං ගෙට එන්ඩ'' කුරුල්ලන්ට, ලේනුන් වැනි සතුන්ට ආහාර ලබා දී ඒ දෙස බලා සිටීමෙන් අපූරු වින්දනයක් ලබන්නට අතීතයේ මෙන්ම වර්තමානයේ දී බොහෝ දෙනෙක් කැමති ය. '' කොස් ඇට දෙකක් අතින් කුඩු කර අසල ඇටඹ ගස මුල තිබූ පෙති ගල මත තබන විට ද ලෙහෙන්නු දෙදෙනෙක් ඒ අසල ගැවසෙමින් සිටිය හ. මහල්ලා ඒ දෙස බලා සිටියේ සන්තෝසයෙනි''. කාමභෝගය වූ කලී මිනිසා උසස්ම සංතෘප්ති තත්ත්වයකට පත් කරනු ලබන මේ විශ්වයේ බිහි වූ අපූරු සංසිද්ධියකි. එය හුදෙක් මානසික සංතෘප්තිය උදෙසා පමණක්ම නොව මානවයාගේ පැවැත්ම කෙරෙහි අත්‍යවශයම වන්නා වූ සත්වයාගෙන් වෙන් වු උසස් මට්ටමේ ක්‍රියාවලියකි. ''ළා නීල දෙරණ තෙල් පහන් දූල්ලට ඇගේ කලව ඔහුට සිහිකළේ ඇත්තෝර දල්ලේ යටි පැත්තේ වූ ඒ අමුතු පැහැයයි. ඔහු ඒ ගැන සිතමින් කලවයේ කල්කය ගා පිරිමැද්දේ ය. පිච්චි එකවර කෙටිහාමිගේ අත තදින් අල්ලා ගත්තා ය. කෙටිහාමි සිතුවේ අත ගසා දමාවී කියා ය. එසේ වූයේ නැත.'' '' ඔහු සංතෝෂයෙන් එහෙත් තාලයට ඇද තියමින් ලියද්ද වටා ගමන් කළේ ය. ලිප ළඟ උන් පිච්චි තනියම සිනාසෙමින් එය අසා සිටියා ය.'' '' ගෙයක් නම් ගැහැණියක් සිටිය යුතුයි. පුංචි උන් කෑ ගැසිය යුතුය. පිටුපස බිත්තියේ උදලු හේත්තු කර තිබිය යුතුය. ගේ කුරුලු කූඩුවක් තිබිය යුතුය. බත් දමන ලැල්ලේ නිතර කුරුලු වර්ග සද්ද කළ යුතුය. කුඹුරක් නම් ශක්තිමත් නියරක් තිබිය යුතුය''.

ග්‍රාමීය ජීවිතය තුළ පවත්නා සරල සංසිද්ධීන් සොබා දහම හා සම්මිශ්‍රිතව ගැමියාගේ මනෝභාවය තුළ වින්දනය ගලා යන ආකාරය ගෙන හැර පාන්නට මස්ඉඹුලයන් සවිඥානික වී ඇත. මහින්ද ප්‍රසාද් මස්ඉඹුලගේ '' මාණික්කාවත'' කෘතිය ග්‍රාමීය සිංහල ජනයාගේ ජීවන පැවැත්මේ සරලත්වය සපිරි වින්දනය මොනවට පැහැදිලි කරනු ලබන අපූරු ප්‍රබන්ධයකි.

මහින්ද ප්‍රසාද්, මස්ඉඹුල මාණික්කාවත, 2015, සන්ථව ප්‍රකාශන.